# මාතලේ ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයේ වාර්ෂික සංස්කෘතික උත්සවය තුළින් ගොඩනැගෙන සිංහල, දෙමළ ජනවාර්ගික සම්බන්ධතාවය

ඩබ්. එම්. සී. ඩී. බාලසූරිය

පුරාවිද්‍යා අධ්‍යන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
chamzbale@hotmail.com

---

පුරාණ ශ්‍රී ලංකාවේ බුදු සමය හා සමගාමී ව විවිධ දේවතාවුන් ඇදහීම සහ වන්දනය ප්‍රචලිත ව පැවත තිබේ. එහෙයින් වර්තමානයේත් සිංහල බෞද්ධයින් හින්දු ජාතිකයින් විසින් පවතවනු ලබන ආගමික උත්සවයන්ට සහ පුද පූජාවන්ට සහභාගී වීම දක්නට ලැබේ. ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ලිඛිත මූලාශ්‍රය පරිශිලනය සහ අන්තර්ජාලය භාවිතය ද ක්ෂේත්‍ර ගවේෂණයන් ද යොදාගනු ලැබිණි. මාතලේ හින්දු දේවස්ථාන අතුරින් පැරණි දේවස්ථානයක් වූ ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයේ පවත්වන වාර්ෂික තේරු උත්සවයට එකතු වන ජනකාය අතර සිංහලයින් ප්‍රධාන වේ. මෙම දේවස්ථානයේ නිර්මාතෘවරයා කරුප්පන් නැමැත්තෙක් වන අතර 1852 දී සුප්පාපිල්ලෙ නම් පූජකවරයා කුඩාවට පැවති මෙම දේවාලය විශාල කිරීමට දායක වී ඇත. 1977 දී ප්‍රථමවරට මෙහි වැඩ සිටින පත්තිනි දේවිය උදෙසා තේරු රථ නිර්මාණය කර පුද පූජාවන් පවත්වමින් මාතලේ නගරයේ වීථි සංචාරයේ යෙදී තිබේ. වර්තමානයේ නවම් මස ශ්‍රේෂ්ඨ නැකැත් අළලා පෙරහැර වැඩම කරවීම සිදු කෙරේ. බෞද්ධාගම තුළ කිසි විටෙකත් යාඥා කිරීමක දක්නට නොලැබුණ ද සිංහල බෞද්ධ ජනයා මෙම උත්සවයට සහභාගීත්වයට හේතුවන්නේ එදිනෙදා ජීවිතයේ චෛතසික හා ශාරීරික නොසන්සුන්තාවයන් සඳහා සහනයක් ළඟා කරගැනීමේ අපේක්ෂාවෙනි.

ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයේ පවත්වන වාර්ෂික තේරු උත්සවයට බහුවාර්ගික අතර සබඳතා ගොඩනැගීමට අංගයන්ගේ දායකත්වය වන ආකාර කිහිපයක් මෙහිදී හඳුනාගනු ලැබිණි. උත්සව මාසය පුරාවට පත්තිනි දේවිය උදෙසා පුද පූජාවන්ට සහභාගී වන සිංහල, දෙමළ ජනයා තම පූජාවන් දෙවියන් වෙත පූජා කිරීම සිදු කෙරෙන අතර ඒවා කිසිදු වෙනසකින් තොරව ඒ අයුරින්ම භාර ගෙන පූජා පවත්වයි. ගිනි පෑගීමට මස් මාංශ, මත්පැන්වලින් වැළකී සිටිය යුතු අතර දෙමළ ජනයා පමණක් නොව සිංහල ජනයා ද එයට පේවී කටයුතු කරයි. කාවඩි පෙරහැරට ද ඔවුන් එකමුතුව සහභාගී වේ. දේවස්ථානයෙන් ලබා දෙන දේව ආහාරය සියලුදෙනාම එක්වී සාමූහිකව ඉමහත් භක්තියෙන් ආහාරයට ගනියි. තේරු රථයට දෙවියන් වැඩම කරවීම හා රථය ඇදීමට සියලුදෙනාම සාමූහිකව සහභාගීවීමෙන් අපේක්ෂා කරනුයේ සියල්ලන්ට එකලෙ පින් අත්කරගැනීමය. අස්පර්ශීය උරුමයන් වන මෙවැනි සංස්කෘතික උත්සව හා පුද පූජාවන් තුළින් බහුවාර්ගික සම්බන්ධතාවය ගොඩනැගීමට දායක වේ.

ප්‍රමුඛ පද: බහු සංස්කෘතික, බහු වාර්ගික, අභිචාර